රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2017

මගේ අංකය : EST/6/06/TVL/3010
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.02.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>අධිවේගී මාර්ගවල ගමන් කිරීම වෙනුවෙන් ගෙවූ ප්‍රවේශපත්‍ර ගාස්තු ප්‍රතිපූරණය කිරීම</u>

සාමාන්‍ය දෛනික රාජකාරී නොවන විශේෂිත රාජකාරී සඳහා නිලධරයෙකු අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධරයාගේ හෝ ගණන් දීමේ නිලධරයාගේ පූර්ව අනුමතිය ඇතිව අධිවේගී මාර්ගය භාවිත කළ අවස්ථාවක දී ඒ සඳහා භාවිත කළ වාහනය වෙනුවෙන් ගෙවූ ප්‍රවේශ ගාස්තුව හෝ සුඛෝපභෝගී බස් රථයක ගමන් කළ අවස්ථාවක දී ඒ සඳහා වැය කළ ප්‍රවේශ පත්‍ර ගාස්තුව ප්‍රතිපූරණය කළ හැක.

02. අධිවේගී මාර්ග භාවිත කිරීමෙන් සාමාන්‍ය මාර්ග භාවිත කිරීමේ දී රජයට දැරීමට සිදුවන පිරිවැයට වඩා වැඩි පිරිවැයක් දැරීමට සිදු නොවන බවට පෞද්ගලිකව සෑහීමකට පත්වීමෙන් පසු නිලධරයෙකුට අධිවේගී මාර්ගය භාවිත කර රාජකාරී සඳහා යාමට පූර්ව අනුමතිය දීම අදාළ බලධරයන්ගේ වගකීමකි.

03. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2017.01.01 දින සිට ක්‍රියාත්මක වේ. 2017 වර්ෂයේ දී සියලුම ආයතන තම ප්‍රතිපාදන සීමාව තුළ මේ සඳහා වැයවන වියදම් කළමනාකරණය කරගත යුතු අතර මේ වෙනුවෙන් මහා භාණ්ඩාගාරය වෙතින් අමතර ප්‍රතිපාදන ඉල්ලා නොසිටිය යුතුය.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය